**විෂයය - බුද්ධ ධර්මය - 7 ශ්‍රේණිය**

**නිපුණතාව - බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැදින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි**

**නිපුණතා මට්ටම - චතුරාර්ය සත්‍ය හැදින ධර්මය කෙරෙහි පැහැදීමෙන් කටයුතු කරයි**

**පාඩම –**16 පාඩම - චතුරාර්ය සත්‍ය

# 7 ශ්‍රේණිය

# 16 පාඩම - චතුdrරාර්ය සත්‍ය

## I - කොටස

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. බුදුරජාණන් වහන්සේගේ පළමු ධර්ම දේශනාව වනුයේ

   1. මහා මංගල සූත්‍රයයි. 2. දම්සක් පැවතුම් සූත්‍රයයි.

   3. කරණීය මෙත්ත සූත්‍රයයි. .4 රතන සූත්‍රයයි.

2. ජාති ආගම් කුල භේදයකින් තොරව සියලු සත්වයන්ට උරුම වී ඇති මූලික ගැටලුව නම්

   1. වසංගත රෝගවලට ගොදුරු වීමය 2. තම කැමති දේ නොලැබීමය

   3. ආහාර ආදිය නොලැබීමය .4 සංසාරය දුක් සහිත වීමයි

3. දුක්ඛ සමුදය ආර්ය සත්‍යයෙන් පැහැදිලි කරනුයේ

   1. දුක හට ගැනීමයි 2. දුක් සහිත බවට හේතුවයි

   3. දුක් නැති කිරීමයි .4 දුක නැති කිරීමේ මාර්ගයයි

4. බුදුවරයෙකු ලොව පහළ වෙන්නේ

   1. ආගමක් දේශනා කිරීමටයි

   2. චතුරාර්ය සත්‍ය ලොවට පැහැදිලි කිරීමටයි

   3. රට පාලනය කිරීමට අවශ්‍ය උපදෙස් දීමටයි

   .4 ලෝකයේ පැවැත්ම පිළිබඳ පැහැදිලි කිරීමටයි

5. අධික ලෙස කම් සැප විඳීමේ අන්තගාමී පිළිවෙත හැඳින්වෙන්නේ

   1. අත්ථකිලමතානුයෝගය නමිනි 2. මධ්‍යම ප්‍රතිපදාව නමිනි

   3. කාමසුඛල්ලිකානුයෝගය නමිනි 4. විභව තණ්හා නමිනි

6. තෘෂ්ණාවේ ආකාර තුනකි.එයින් පංචේන්ද්‍රියන් පිනවීමට ඇති කැමැත්ත හඳුන්වන්නේ කුමන නමින් ද?

   1. භව තණ්හා 2. කාම තණ්හා

   3. විභව තණ්හා 4. දාන තණ්හා

7. භව තණ්හා යනු

   1. පංචේන්ද්‍රියන් පිනවීමට ඇති කැමැත්තයි 2. සසර ඉපදීමට ඇති කැමැත්තයි

   3. නිවන් දැකීමට ඇති කැමැත්තයි 4. බණ ඇසීමට ඇති කැමැත්තයි

8. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සඳහන් "සම්මා දිට්ඨි" යනු

   1. නිවැරදි කල්පනාවයි 2. නිවැරදි දිවි පැවැත්මයි

   3. නිවැරදි දැකීමයි 4. නිවැරදි සිහියයි



සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල

9. ත්‍රිවිධ ශික්ෂාව නම්

1. බුද්ධ රත්නය,ධම්ම රත්නය හා සංඝ රත්නය යි 2. දාන,සීල හා භාවනා යි

3. සිත,කය හා වචනය යි 4. පඤ්ඤා, සීල හා සමාධි යි

10. අනුන් නැසීමෙන් වැළකීමේ කල්පනාව හඳුන්වන්නේ

1. නෙක්ඛම්ම නමිනි 2. අව්‍යාපාද නමිනි

3. අවිහිංසාව නමිනි 4. ව්‍යාපාද නමිනි

# 7 ශ්‍රේණිය

## 16 පාඩම - චතුරාර්ය සත්‍ය

## II - කොටස

1. චතුරාර්ය සත්‍ය  පිළිවෙළින් ලියන්න
2. බුද්ධ කාලය වන විට පිළිගත් අන්තගාමී පිළිවෙත් දෙක නම් කරන්න
3. දුක්ඛ ආර්ය සත්‍යයේ සඳහන් වන පරිදි සත්ත්වයා දුකට පත් වන අවස්ථා  සඳහන් කරන්න
4. ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිබඳ පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
   i. ආර්ය අෂ්ටාංගික මාර්ගය නම් කරන්න .
   ii. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සඳහන් " සම්මා කම්මන්ත" යන්න කෙටියෙන් හඳුන්වන්න
5. චතුරාර්ය සත්‍ය දහමෙහි  ඉගැන්වෙන ආකාරයට ගැටලුවක් විසඳා ගන්නා ආකාරය පැහැදිලි කරන්න



සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල

# 7 ශ්‍රේණිය

## 16 පාඩම - චතුරාර්ය සත්‍ය

## පිළිතුරු

## I - කොටස

1. දම්සක් පැවතුම් සූත්‍රය
2. සංසාරය දුක් සහිත වීමයි
3. දුක් සහිත බවට හේතුවයි
4. චතුරාර්ය සත්‍ය ලොවට පැහැදිලි කිරීමටයි
5. කාම සුඛල්ලිකානුයෝගය නම්නි
6. කාම තණ්හා
7. සසර ඉපදීමට ඇති කැමැත්තයි
8. නිවැරදි දැකීමයි
9. පඤ්ඤා, සීල හා සමාධි යි
10. අව්‍යාපාද නමනි

## II - කොටස

1. දුක්ඛ ආර්ය සත්‍ය , දුක්ඛ සමුදය ආර්ය සත්‍ය , දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය , දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍ය
2. කාමසුඛල්ලිකානුයෝගය , අත්ථකිලමතානුයෝගය
3. ඉපදීම , ජරාවට පත්වීම , මහලු වීම , රෝග පීඩාදියට පත්වීම , අප්‍රියයන් සමග එකතු වීමට සිදුවීම, මරණයට පත්වීම , ප්‍රියමනාප අයගෙන් වෙන්වීමට සිදුවීම , සිතන පතන කැමති දේ නොලැබීම යනාදියයි .
4.

   i. සම්මා දිට්ඨි , සම්මා සංකප්ප , සම්මා වාචා , සම්මා කම්මන්ත , සම්මා ආජීව , සම්මා වායාම, සම්මා සති , සම්මා සමාධි

   ii. නිවැරදි යහපත් ක්‍රියාවල නිරත වීමයි.එනම් සතුන් මැරීම ,සොරකම් කිරීම , කම් සැප විඳීම, යන කායික අකුසල්වලින් වැළකීමයි. සතුන්ට කරුණාව දක්වමින්, දුන් දේ පමණක් ගනිමින් ශිෂ්ට සම්පන්න ලෙස කම් සුව විඳිමින් ජීවත් වීමයි

5. ගැටලුවේ ස්වභාවය තේරුම් ගැනීම .

   ගැටලුව පැන නැගීමට හේතු වූ කරුණු වටහා ගැනීම

   එම හේතු ඉවත් වූ විට ගැටලුව විසඳෙන බව



සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල